දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின்-அஞ்சல்
E - mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. PSC/APL/10/AT/ ARCHEOLOGIST/2025 (2026)

ඔබේ අංකය / உமது இல. / Your No. NH/AD/ARC/16/06

දිනය / திகதி / Date 2026.03. 17

ලේකම්
බුද්ධශාසන. ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

**2026 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය (ඒකාබද්ධ සේවය හැර)**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන ඔබගේ සමාංක හා 2025.12.23 දිනැති ලිපිය හා බැඳේ.

02. ඉහත සඳහන් සේවාවන්හි නිලධරයන් සම්බන්ධයෙන් ඔබ විසින් අනුමත කරන ලද 2026 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

03) එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා යැවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2(ඇ) සහ (ඇ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

04) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බව ද කාරුණිකව දැනුම් දෙමි.

05) එසේම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය (ඒකාබද්ධ සේවය හැර) සම්බන්ධයෙන් වන ඉල්ලීම් හා ඒ සම්බන්ධයෙන් වන නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත
01. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව - කරු/ දැ.ගැ.ස.

# වාර්ෂික ස්ථාන මාරු - පුරා විද්‍යා දෙපාර්තමේන්තුව

## 2026

| අනු අංකය | නම | සේවා විස්තර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලද සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය |
|---|---|---|---|---|---|
| 01 | එච්. ජී. කුමාරසිංහ | පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී - II පන්තිය | බදුල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | ලබා දී නැත. | අභියාචනය නිෂ්ප්‍රභ කර 2027 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම සලකා බලන ලෙස පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |
| 02 | එස්. එස්. එස්. බණ්ඩාර | කැණීම් සහකාර- II පන්තිය | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අනුරාධපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කර ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම. |
| 03 | ආර්.එම්. ඩබ්ලිව්. කේ. රත්නායක | රසායන සංරක්ෂණ ශිල්පි | වයඹ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | බස්නාහිර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කර ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම. |
| 04 | එම්. ඒ. එන්. එස්. බණ්ඩාර | වඩු කාර්මික I පන්තිය | ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය කෑගල්ල | බස්නාහිර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කර ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම. |
| 05 | ඩී. එම්. පී. එම්. දිසානායක | වඩු කාර්මික II පන්තිය | පොළොන්නරුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | ස්ථාන මාරු ලබා දී නැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම. |
| 06 | ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. බංඩා | පුරාවිද්‍යා සහයක - II පන්තිය | මධ්‍යම පුරාවිද්‍යා කාර්යාලය | බදුල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අභියාචනයට ඉඩ දෙමින් ස්ථාන මාරුව අවලංගු කිරීම. |
| 07 | ජී. එල්. ඩබ්ලිව්. ගමගේ | පුරාවිද්‍යා සහයක - II පන්තිය | පොළොන්නරුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | ස්ථාන මාරු ලබා දී නැත | අභියාචනය නිෂ්ප්‍රභ කර 2027 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම සලකා බලන ලෙස පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දීම. |

10.03.2026

| | | | | | |
|---|---|---|---|---|---|
| 08 | ඒ.ආර්.අශෝක බණ්ඩාර | පුරාවිද්‍යා සහයක - II පන්තිය | පොළොන්නරුව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | ස්ථාන මාරු ලබා දී නැත | අභියාචනයට ඉඩ ලබා දෙමින් අනුප්‍රාප්තිකයෙකු රහිතව අනුරාධපුර ප්‍රාදේශීය පුරා විද්‍යා කාර්යාලයට ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීම. |
| 09 | එස්.එන්.ජී.පී. සුනිල් පියතිස්ස | පැස්සුම් ශිල්පී - I පන්තිය | වයඹ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම. |

10.03.2026